# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/10/01/25/114 | ඔබේ අංකය / உனது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2023.02 20 |
|---|---|---|---|---|---|

ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (අභ්‍යන්තර විගණන) 01/2020 ( II )

සියලුම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්,
ගණන්දීමේ නිලධාරීන්.

<u>විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.</u>

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලදී ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම සම්බන්ධයෙන් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන් , දෙපාර්තමේන්තු ප්‍රධානීන් , දිස්ත්‍රික් ලේකම්වරුන් ඇමතූ 2023.01.23 දිනැති DMA/01 -2023 අංක දරණ කළමනාකරණන විගණන මාර්ගෝපදේශ ලිපිය හා බැදේ.

02.උක්ත ලිපියට අනුව පසුගිය කාලය තුළ සියලු රජයේ ආයතනවල පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් තුළ විගණකාධිපති විගණන විමසුම්, අභ්‍යන්තර විගණන වාර්තා සහ වෙනත් කළමනාකරණමය කරුණු ඇසුරෙන් සාකච්ඡාවට බදුන් කරනු ලැබූ බොහෝ කරුණු සඳහා ඉතා සාර්ථක විසදුම් ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, ඇතැම් කරුණු විසදුමකින් තොරව නැවත නැවත සාකච්ඡා කරනු ලබන බව එකී ලිපියේ සඳහන් කර ඇත.

03. ඒ අනුව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ ඵලදායිතාව වඩාත් ඉහළ නංවා ගැනීම සඳහා අනුගමනය කළයුතු උපදෙස් කරුණු අංක 4 ( I ) සිට 4 ( iv ) හි දක්වා ඇත. (මාර්ගෝපදේශ ලිපිය අමුණා ඇත)

04.ඉහත අංක 03 ට අනුව පෙන්වා දී ඇති ක්‍රියාමාර්ග අනුගමනය කර ඇමුණුම 01 ප්‍රකාරව ලේඛණයට ඇතුළත් කර ඇති කරුණු අතරින් , මාස 06 ක් ඇතුළත විසඳා ගැනීමට අසමත් වී ඇති කරුණු පිළිබඳ අධ්‍යනය කර ඒවා ඇතුළත් වාර්තාවක් ඔබ විසින් සකස් කළ යුතුය.

05.මෙම ක්‍රියාමාර්ග අනුගමනය කරමින් විගණන කළමනාකරණ කමිටු රැස්විමේ ඵලදායිතාව හා කාර්යක්ෂමතාව වර්ධනය කර ආයතනයේ මූල්‍ය විනය හා කාර්ය සාධන මට්ටම ශක්තිමත් කර ගැනීම සඳහා කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටින අතර මෙම මඟපෙන්වීම් 2023.01.01 දින සිට ක්‍රියාත්මක වන බව ද දැනුම් දෙමි.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343
කාර්යාලය / காரியாலயம் / Office 091 4119010 091 2226118
ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

06. මීට අමතරව මා විසින් 2020.12.22 දින නිකුත් කළ ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (අභ්‍යන්තර විගණන) 01/2020 හා 2022/07/25 දිනැති අංක 01/2020/(I) ද බලාත්මක වන බවද වැඩි දුරටත් දැනුම් දෙමි.

සුමිත් අලහකෝන්
ප්‍රධාන ලේකම්
දකුණු පළාත.

පිටපත්:-

1.අධ්‍යක්ෂ ජනරාල් -කළමනාකරන විගණන දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස
2.නියෝජ්‍ය ප්‍රධාන ලේකම්-මුදල් - දැ.ගැ.ස
3.ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති - දැ.ගැ.ස
4.අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම් /මුදල්/අයවැය) - දැ.ගැ.ස

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
முகாமைத்துவக் கணக்காய்வுத் திணைக்களம்
DEPARTMENT OF MANAGEMENT AUDIT

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01
செயலகம், கொழும்பு 01
The Secretariat, Colombo 01

මගේ අංකය / எனது இல / My No: DMA/AMC/M/2023/02

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2023.01.23

කළමනාකරණ විගණන මාර්ගෝපදේශ :- DMA/01-2023

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්

<u>විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලදී ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම</u>

අප දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2019.01.12 දිනැති අංක DMA/01-2019 දරණ කළමනාකරණ විගණන චක්‍රලේඛය, 2019.05.21 දිනැති DMA/01/2019/Letter දරණ කළමනාකරණ විගණන චක්‍රලේඛ ලිපිය සහ 2020.08.26 දිනැති පළාත් අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ අංක 01 මගින් විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීම සහ එම රැස්වීම් පැවැත්වීම සම්බන්ධ විධිවිධාන සහ ඒ සඳහා භාවිතා කළ යුතු ආදර්ශ ආකෘති හඳුන්වා දී ඇත.

02. පසුගිය කාලය තුල සියලු රජයේ ආයතන වල පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් තුල විගණකාධිපති විගණන විමසුම්, අභ්‍යන්තර විගණන වාර්තා සහ වෙනත් කළමනාකරණමය කරුණු ඇසුරෙන් සාකච්ඡාවට බඳුන් කරනු ලැබූ බොහෝ කරුණු සඳහා ඉතා සාර්ථක විසඳුම් ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, ඇතැම් කරුණු විසඳුමකින් තොරව නැවත නැවත සාකච්ඡා කරනු ලබන බවද වාර්තා වී ඇත. එවැනි කරුණු රැස්වීම් වාර 20 කටත් වඩා වැඩි වාර ගණනක් තුල සාකච්ඡා කල අවස්ථා ද දක්නට ලැබේ. මෙම තත්ත්වය නිසා වර්තමානයේ විගණන වාර්තා මගින් පෙන්වා දෙනු ලබන ඉතා වැදගත් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීමට යොදවන කාලය අවම වී ඇති බවද නිරීක්ෂණය වේ. මෙවැනි සමහර වැදගත් කරුණු කිසිදු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමකදී සාකච්ඡාවට භාජනය නොවීම නිසා රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ ප්‍රශ්න කිරීම් වලට ද ලක් වන බව නිරීක්ෂණය වේ.

03. ඉහත තත්ත්වය වලක්වා ගැනීමට සෑම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමකදීම, ඊට පෙර කාර්තුව දක්වා ඉදිරිපත් වූ විගණකාධිපති විගණන විමසුම්, අභ්‍යන්තර විගණන වාර්තා හා වෙනත් කළමනාකරණමය කරුණු මගින් පෙන්වා දී ඇති, ආයතනයේ කාර්යසාධනයට හා මූල්‍ය විනය යහපත්ව පවත්වාගෙන යාමට වඩාත් වැදගත් වන කරුණු කල් ගත වීමට පෙර සාකච්ඡා කර ඒවා සඳහා කඩිනම් විසඳුම් ලබා ගැනීමෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වඩාත් ඵලදායී තත්වයට පත් කර ගත හැකිය.

04. ඒ අනුව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ ඵලදායීතාව වඩාත් ඉහල නංවා ගැනීම සඳහා පහත පියවරයන් අනුගමනය කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

කාර්යාලය / அலுவலகம் / Office: 2484816, 2484500, 2484600, 2484700
අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General: 2484543
ෆැක්ස් / பெக்ஸ் / Fax: 2449496
වෙබ් අඩවිය / வெப் சைட் / website: www.treasury.gov.lk

i. ඔබ ආයතනයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව තුල ඇතුලත් කරුණු අතුරින් කමිටු රැස්වීම් 06 ක හෝ ඊට වැඩි සංඛ්‍යාවකදී සාකච්ඡා කර විසඳී නොමැති ගැටලු, මෙහි අමුණුම් 01 ප්‍රකාර ලේඛණයකට ඇතුලත් කර එම නොවිසඳී ඇති කරුණු සඳහා පහත ක්‍රියාමාර්ග ගත යුතුය.

(අ) ඉහත සඳහන් නොවිසඳී ඇති කරුණු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම සඳහා වගකිව යුතු නිලධාරියෙකු / නිලධාරීන් විගණන හා කළමනාකරණ කමිටුව විසින් නිශ්චය කිරීම.

(ආ) විගණන හා කළමනාකරණ කමිටුවේ බලසීමාව තුල එම නොවිසඳී ඇති කරුණු සඳහා ගත යුතු විසඳුම් ක්‍රියාමාර්ග තීරණය කිරීම.

ii. මෙහි ඇමුණුම 01 ප්‍රකාර ලේඛණයට ඇතුලත් කරනු ලබන විසඳී නොමැති ගැටලු සඳහා ඉදිරි මාස 06 තුළ විසඳුම් ක්‍රියාමාර්ග ගැනීමේ වගකීම ඉහත i(අ) හි සඳහන් අදාල නිලධාරියාගේ / නිලධාරීන්ගේ වගකීමට යටත් කිරීම.

iii. මෙහි ඇමුණුම 01 ප්‍රකාර ලේඛණයට ඇතුලත් කරනු ලබන කරුණු සම්බන්ධයෙන් වගකීම පැවරුණු නිලධාරියා / නිලධාරීන් තමා වෙත පැවරුණු වගකීම ඉතා කඩිනමින් නිම කර ඒ සඳහා ගත් ක්‍රියාමාර්ග ප්‍රධාන අභ්‍යන්තර විගණක/අභ්‍යන්තර විගණක/අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ මඟින් එළඹෙන විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීම.

iv. සෑම වර්ෂයකම අවසන් කාර්තුවේ පැවැත්වෙන විගණන හා කළමනාකරණ කමිටුවේදී, මෙහි ඇමුණුම 01 ප්‍රකාර ලේඛණයෙහි ඇතුලත් කරුණු වල ප්‍රගතිය නැවත සමාලෝචනය කිරීම.

05. ඉහත පියවරයන් පහසු කර ගැනීම සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් 2019.05.21 දිනැති අංක DMA/01/2019/Letter දරණ චක්‍රලේඛ ලිපිය මඟින් මහ පෙන්වීම් සිදු කර ඇති පරිදි විගණන කමිටු වාර්තාවේ ඇතුලත් කරුණු සාකච්ඡා කළ වාර ගණන අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය.

06. ඉහත 04 (i) සිට (iv) දක්වා කරුණු මඟින් පෙන්වා දී ඇති ක්‍රියාමාර්ග අනුගමනය කර, මෙහි ඇමුණුම 01 ප්‍රකාර ලේඛණයට ඇතුලත් කර ඇති කරුණු අතරින්, මාස 06 ක් ඇතුලත විසඳා ගැනීමට අසමත් වී ඇති කරුණු පිළිබඳ අධ්‍යනය කර ඒවා ඇතුලත් වාර්තාවක් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් ඔබ වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.

07. මෙහි ඇමුණුම 01 ප්‍රකාර ලේඛණයේ තොරතුරු පවත්වාගෙන යාම, ප්‍රගතිය විමසීම සහ වගකීම් පැවරුණු නිලධාරියා / නිලධාරීන් ගෙන් අදාල තොරතුරු කැඳවීම ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ / අභ්‍යන්තර විගණකගේ / අභ්‍යන්තර විගණක අධ්‍යක්ෂකගේ සෘජු වගකීමක් වන්නේය.

08. මෙහි ඇමුණුම 01 ප්‍රකාර ලේඛණයෙහි ඇතුලත් ගැටලු සඳහා විසඳුම් ක්‍රියාමාර්ග ගැනීමේ වගකීම් පැවරෙන නිලධාරියා / නිලධාරීන් නිසි පරිදි ක්‍රියා නොකරන හා ප්‍රමාද වීම් සිදු කරනු ලබන අවස්ථා වලක්වා ගැනීමට ඔබගේ සෘජු අවධානය යොමු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

09. ඉහත ක්‍රියාමාර්ග අනුගමනය කරමින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ ඵලදායීතාවය හා කාර්යක්ෂමතාව වර්ධනය කර ආයතනයේ මූල්‍ය විනය හා කාර්යසාධන මට්ටම ශක්තිමත් කර ගැනීම සඳහා කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි. මෙම මඟපෙන්වීම 2023.01.01 දින සිට බලපැවැත්වේ.

එස්.ජේ.චන්ද්‍රිකා කුලතිලක
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත - විගණකාධිපති - කරු.දැ.ගැ.ස

ඇමුණුම - 01

**විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 06ක් හෝ ඊට වැඩි වාර ගණනකදී සාකච්ඡා කළ එහෙත් විසදී නොමැති කරුණු**

| අනු අංකය | කමිටු වාර්තාවේ කාරණයට අදාල අංකය | ගැටලුව/ කාරණය (කෙටියෙන්) | සාකච්ඡා කල වාර ගණන | කමිටුව මගින් ගන්නා ලද තීරණය (කෙටියෙන්) | වගකීම පැවරෙන නිලධාරියාගේ/නිලධාරීන්ගේ නම හා තනතුර | ගැටලුව/කාරණය විසඳා අවසන් කළ දිනය | විසඳුම් ක්‍රියාත්මක කිරීමෙන් ලබා ගත් ප්‍රතිඵලය |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |